## IV වන පරිච්ඡේදය.

## බටලන්ද නිවාස යෝජනා ක්‍රමය

1990 දශකයේ මුල් කාලයේදී එවකට පැවති රජය ඇතැම් අත්‍යවශ්‍ය පොහොර ශ්‍රී ලංකාවේම නිෂ්පාදනය කිරීමට තීරණය කළේය. පොහොර වර්ග මෙරට නිෂ්පාදනය කිරීමේ ප්‍රතිඵලය ලෙසට පොහොර නිෂ්පාදනය සඳහා දරන වියදම් අඩුවනු ඇතැයි ද, ඒ හේතු කොට ගෙන කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදන වියදම් අඩුවනු ඇතැයි ද බලාපොරොත්තු වන ලදී. මෙම අරමුණු ඉටුකර ගැනීමට රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව පිහිටුවන ලදී.

අළුතින් පිහිටුවන ලද සංස්ථාවේ මූලික ව්‍යාපෘති වලින් එකක් වූයේ යූරියා නිෂ්පාදන යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීමය. මීට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර එක්සත් රාජධානියේ කෙලොක් නමැති සමාගමකින් ලබාගන්නා ලදී. යන්ත්‍රාගාර ශ්‍රී ලංකාවේ එකලස් කොට එය කලක් නඩත්තු කිරීමේ කාර්යය එම සමාගමට භාර කරන ලදී. යන්ත්‍රාගාරය පිහිටුවීමත් , යූරියා යන්ත්‍රාගාරය සම්බන්ධ වැඩ කටයුතු සඳහා විශේෂ රසායනාගාරයක් පිහිටුවීම සඳහාත් සපුගස්කන්දේ පිහිටි භූමියක් තෝරාගනු ලැබිණ. මේ සඳහා විදේශීය කාර්මික විශේෂඥයින් ශ්‍රී ලංකාවේ සෑහෙන කාලසීමාවක් නැවති සිටීමට අපේක්ෂා කරන බැවින්, ඔවුනට ශ්‍රී ලංකාවේ නැවතී සිටින කාලසීමාව තුළ වාසය කිරීම සඳහා නිවාස යෝජනා ක්‍රමයක් ගොඩනැගීමට තීරණය කරන ලදී. මෙම කටයුත්ත සඳහා අක්කර 20ක පොල් ඉඩමක් තෝරා ගන්නා ලදී. මෙම ඉඩම පිහිටා තිබුනේ බටලන්ද ගමේය. බටලන්ද පිහිටියේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාසයේය. කොළඹ - නුවර මාර්ගයෙන් ගමන් කරන විට කිරිබත්ගොඩ මංසන්ධියෙන් ඇරඹෙන මාර්ගයක් බියගම කරා දිවෙයි. මෙම මාර්ගය දිවෙන්නේ කොළඹ සිට යන විට දකුණු පැත්තටය. බියගම මාර්ගය සපුගස්කන්ද ටවුම ඔස්සේ බියගමට දිවෙයි. සපුගස්කන්ද ටවුමට ළඟාවීමට මඳකට කලින් වමට හැරී යන මාර්ගයකි. මෙම මාර්ගය පටන් ගන්නේ සපුගස්කන්ද පොලිස් ස්ථානය ඉදිරිපිටම වාගේය . ( සපුගස්කන්ද පොලිස් ස්ථානය පිහිටා තිබෙන්නේ කිරිබත්ගොඩ - බියගම මාර්ගයේ දකුණු පසිනි.) මෙම හන්දියෙන් හැරී කිලෝමීටර් දෙකක් යනවිට බටලන්ද ගම හමුවේ. නිවාස යෝජනා ක්‍රමය තැනීම සඳහා තෝරා ගන්නා ලද කලින් සඳහන් කළ ඉඩම පිහිටා තිබෙන්නේ මෙම ගම මධ්‍යයේය. මෙම ඉඩම පිහිටා තිබෙන්නේ යූරියා නිෂ්පාදන යන්ත්‍රාගාරය හා රසායනාගාරය ඇතුළත් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථා භූමියට කිලෝමීටර දෙකහමාරක් ඈතිනි.

1970 දශකයේ මුල් භාගයේදී විදේශික නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා මෙම නිවාස ක්‍රමයේ වැඩ නිමවන ලදී. එය වෙන්කළ නිවාස ඒකක 64 කින් යුක්තවිය. මූලික වශයෙන් මෙහි තුන් වර්ගයක නිවාස තිබේ. " A" වර්ගයේ නිවාස 10කි. මේවා දෙමහල් නිවාසය. "B" වර්ගයේ නිවාස 15 කි. මේවා තනි මහලේ ගෙවල්ය. එක් ඒකකයක වෙන්කළ නිවාස දෙකකි. "C" වර්ගයේ නිවාස 43 කි. මේවා නිදන ශාලා ස්වභාවයේ ඒකකය. සියළුම නිවාසවලට නොම්මර යොදා ඇත. මෙම නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ඒ සඳහා පාවිච්චි කර ඇති පොල් ඉඩමේ තැන තැන විසිර තිබේ. ඇත්ත වශයෙන්ම, මුලින් තිබුණු පොල් ගස් තවමත් ඇත. බටලන්ද ගමේ මාර්ගයේ සිට එක් ඇතුල්වීමේ / පිටවීමේ ගේට්ටුවක් බැගින් නිවාස යෝජනා ක්‍රමයට තිබේ. නිවාස යෝජනා ක්‍රමය තුළ තාර දැමූ මාර්ග පද්ධතියක් තිබේ. නිවාස යෝජනා

ක්‍රමයේ වම් පසට හා දකුණු පසට බටලන්ද ගම විහිද ඇත. පසු පසට වන්නට විශාල වෙල් යායක් තිබේ. සම්පූර්ණ නිවාස යෝජනා ක්‍රමය ආරක්ෂක කටු කම්බි වැටකින් වට කර තිබේ.

නිවාස යෝජනා ක්‍රමය මැද කාර්යාල සංකීර්ණයක් තිබේ. එහි සමාජශාලා ගොඩනැගිල්ලක් හා පිහිනුම් තටාකයක් ද ඇත.

කොමිෂන් සභාව නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධව වැදගත් තොරතුරු රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු වූ අශෝක සේනානායක මහතාගෙන් ලබාගත්තේය. සේනානායක මහතා වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. 1984 දී රජයට අයත් වාණිජ ව්‍යාපාරයක් වූ යුනයිටඩ් මෝටර්ස් සමාගමේ හිසි බලධාරියා ලෙස ක්‍රියා කළ ඔහු ඉක්බිතිව, එවකට කර්මාන්ත අමාත්‍යවරයා වූ අභාවප්‍රාප්ත සිරිල් මැතිව් මහතා විසින් ඔහු සංස්ථාවේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ ලෙස පත් කළේය. එසේ පත්කරන අවස්ථාවේ, එම සංස්ථාව අඛණ්ඩවම අලාභ විඳින බැවින් එය ඇවර කිරීමට කල් ඇතිවම තීරණය කොට ඇතැයි සේනානායක මහතාට උපදෙස් දී ඇත. එසේ වුවද, මෙම ව්‍යාපෘතියට මුදල් ආධාර සපයා ඇති විදේශීය ආයතන එය ඇවර කිරීමට විරුද්ධවී ඇත. එහෙයින් සංස්ථාව නැවත ප්‍රාණවත් කොට එය අලාභ නොවිඳ පවත්වාගෙන යාහැකි තත්ත්වයට පත්කිරීමට තැත් කරන ලෙස සේනානායක මහතාට උපදෙස් දී ඇත. එසේ වුවද, කළමනාකාරීත්වය විසින් සංස්ථාව නැවත ප්‍රාණවත් කිරීමට ගත් මහන්සිය සාර්ථක වූයේ නැත. මෙම සංස්ථාව ඇවර කිරීමට හෝ සංස්ථාවේ කළමනාකරණය පෞද්ගලික සංවිධානයකට විකිණීමට 1986 දී රජය නැවත තීරණය කළේය. එවකට කර්මාන්ත අමාත්‍යවරයා වූ ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා විසින් සංස්ථාවේ ඇවරකරු ලෙසට අශෝක සේනානායක මහතා පත්කරන ලදී. 1997 දී සේනානායක මහතා සාක්ෂිදීමට කොමිෂන් සභාව ඉදිරියට කැඳවන විටත්, සංස්ථාව ඇවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණවී නොතිබිණ.

1980 දශකයේ මුල් භාගයේ දී විදේශිකයෝ දිවයිනෙන් බැහැරව ගියහ. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව නිවාස යෝජනා ක්‍රමයේ නිවාස සමහරක් එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට වෙන් කොට දුන්නේය. තවත් නිවාස සමහරක් විධිමත් ගිවිසුම් මත ලංකා විදුලිබල මණ්ඩලයට විධිමත්ව වෙන්කොට දෙන ලදී. මෙම නිවාස ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් සමහරක් විසින් පදංචියට යොදා ගන්නා ලදී. තවත් නිවාස ටිකක් "ඇල්පෙකස් සිකියුරිටි" නමින් හැඳින්වූ පෞද්ගලික ආරක්ෂක සමාගමක ආරක්ෂක නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කර දෙන ලදී. මෙසේ කරන ලද්දේ සංස්ථාවේ ආරක්ෂාව මෙම පෞද්ගලික ආරක්ෂක සමාගමේ නිලධාරීන්ට භාර කොට තිබුනු බැවිනි. මෙම බාහිර කණ්ඩායම් දෙකෙන්ම සංස්ථාව ගෙවල් කුලී අය කළේය. 1980 දශකයේ මැද භාගයේදී රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශය හා යුද්ධ හමුදා මූලස්ථානය යුද්ධ හමුදා කඳවුරක් පිහිටුවීම සඳහා නිවාස යෝජනා ක්‍රමයෙන් කොටසක් යුද්ධ හමුදාවට මුදාලන ලෙස සංස්ථාවට නිල වශයෙන් ඉල්ලීමක් කළේය. මේ අනුව නිවාස යෝජනා ක්‍රමයේ දොරටුවෙන් වම් පැත්තේ වූ පෙදෙසක් ( මේය නිවාස යෝජනා ක්‍රමයෙන් පිටතට නෙරා තිබෙන්නකි) යුද්ධ හමුදාවට දෙන ලදී. යුද්ධ හමුදාව මෙහි කඳවුරක් පිහිටවූ අතර, එම කඳවුර මෙම කොමිෂන් සභාව ක්‍රියාත්මකවූ කාලයේ ද ක්‍රියාත්මක විය.

සංස්ථාව ඇතුළත මෙන්ම පිටස්තර නිලධාරීන්ට විධිමත්ව නිවාස වෙන්කොට දීමෙන් පසුවද තවත් නිවාස ටිකක් හිස්ව තිබිණ.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ කටු සටහනක් X 110 ලෙසින් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් පිට වෙන් කරන ලද නිවාස</u>

( පුද්ගලයින් නීති විරෝධීව රඳවා තබා වධ දීමට පාවිච්චි කරන ලද නිවාස අංක ඉදිරියේ * යන සලකුණ තබා ඇත.)

(1) කලින් සිටි අමාත්‍යවරයාගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ පාවිච්චිය සඳහා.

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/2 | I. රනිල් වික්‍රමසිංහ මහතා යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ සංචාරක බංගලාව. | 1983 මාර්තු 02 වන දින සිට 1989 අප්‍රේල් 30 දක්වා |
| | II. රනිල් වික්‍රමසිංහ මහතා කර්මාන්ත අමාත්‍යවරයාගේ නිල නිවස | 1989 අප්‍රේල් සිට 1994 අගෝස්තු මස දක්වා |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/1 | හිස්ව තිබුනා රනිල් වික්‍රමසිංහ මහතාට වෙන් කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1987 සිට 1989 දක්වා 1989 මැයි සිට 1994 අගෝස්තු මස දක්වා |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 2/3 | I. රනිල් වික්‍රමසිංහ මහතා යටතේ ක්‍රියාත්මක වූ මිනිස් බල උපයෝගිතා අමාත්‍යාංශයට පවරන ලද | 1988 නොවැම්බර් 01 සිට 1989 ඔක්තෝබර් 25 දක්වා |
| | II. වින්සන්ට් ප්‍රනාන්දු මහතා, රනිල් වික්‍රමසිංහ මහතාගේ බංගලා භාරකරු | 1989 ඔක්තෝබර් 25 වන දින සිට 1994 අගෝස්තු දක්වා. |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| A 1/7 | I. රනිල් වික්‍රමසිංහ මහතාට වෙන් කළ ආරක්ෂක නිලධාරීන්. | දළ වශයෙන් 1989 සිට 1994 අගෝස්තු දක්වා. |

සටහන: A1/8 නිවස පිහිටා තිබෙන්නේ මේ නිවස ළඟට ආසන්නතමවය.( ඊට දකුණත පැත්තේ) ඇවරකරු කියා සිටියේ මෙම නිවස හිස්ව තබා තිබුනේ විශාල වශයෙන් අලුත්වැඩියාවන් කිරීමට තිබුනු නිසාය යන්නය. එසේ වුවද යම් යම් පොලිස් නිලධාරීන් එය අනවසරයෙන් අල්ලාගෙන සිටින බවට ඔහුට ආරංචි ලැබිණ. මෙහි මීන්මතු සඳහන් කෙරෙන ක්‍රමය අනුව එය පොලිස් නිලධාරීන්ට වෙන් කළ නිවසක් නොවේ. පුද්ගලයින් නීතිවිරෝධීව මෙම නිවසෙහි රඳවා වධ දෙන ලද බව සාක්ෂිකරු අජිත් ජයසිංහ කියා සිටියේය. ඔහු මෙම නිවස කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය.

| අංකය | පදිංචිව සිටි අය | | කාලසීමාව |
|---|---|---|---|
| * B 2 | I. | පොහොර නිෂ්පාදන සංස්ථාවේ සංචාරක බංගලාව | 1987 |
| | II. | හිස්ව තිබුනා | 1987 සිට 1989 මැයි දක්වා |
| | III. | රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලය | 1989 සිට 1994 අගෝස්තු දක්වා |

සටහන: තමා මෙම නිවසෙහි නීති විරෝධීව රඳවා වධ දෙන ලදැයි සාක්ෂිකරු වී.එම්.බන්දුල කියා සිටියේය. ඔහු රැඳවුම් භාරයෙන් පැන ගියේය. ඔහු නිවස කොමිෂන් සභාවට පෙන්නා දුන්නේය. (පරීක්ෂා කර බැලීම සඳහා කොමිෂන් සභාව නිවාස යෝජනා ක්‍රමයට ගිය අවස්ථාවෙහි) මෙම කාරණය ගැන පසුව කරුණු සඳහන් කරනු ඇත.

| අංකය | පදිංචිව සිටි අය | | කාලසීමාව |
|---|---|---|---|
| * B 1 | I. | පොහොර නිෂ්පාදන සංස්ථාවේ සංචාරක බංගලාව | 1987 දක්වා |
| | II. | හිස්ව තිබුනා | 1987 සිට 1989 මැයි දක්වා |
| | III. | රනිල් වික්‍රමසිංහ මහතාට වෙන්කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1989 සිට 1994 අගෝස්තු දක්වා |

| අංකය | පදිංචිව සිටි අය | කාලසීමාව |
|---|---|---|
| B 7 | පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර මහතා රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරී | 1988 මැයි 01 සිට 1994 අගෝස්තු දක්වා |

සටහන : B 8 නිවස පිහිටා තිබෙන්නේ මෙම නිවස ළඟට ආයත්තනමවය. මෙම නිවසෙහි ( B 8) සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට වෙන්කරන ලද ආරක්ෂක නිලධාරීහු පදිංචිව සිටියහ. තමා මෙම නිවසෙහි නීති විරෝධිව රඳවා තබාගෙන වධ දෙන ලද බව සාක්ෂිකරු අර්ල් සුගි පෙරේරා සාක්ෂි දෙමින් කිය. සාක්ෂිකරු කොමිෂන් සභාවට නිවාසය පෙන්නා දුන්නේය.

II. රනිල් වික්‍රමසිංහ මහතාගේ නියමය පරිදි සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට වෙන් කරන ලද

| අංකය | පදිංචිව සිටියේ | කාලසීමාව |
|---|---|---|
| A 1/ 2 | (I) ඩග්ලස් පීරිස් මූලස්ථාන පොලිස් පරීක්ෂක පෑලියගොඩ. | 1984 අගෝස්තු 18 වන දින සිට 1988 ජූනි මස 20 දින දක්වා |
| | (II) ඩබ්ලිව්. මහනායක මූලස්ථාන පොලිස් පරීක්ෂක පෑලියගොඩ. | 1988 ජූනි මස සිට 1990 මැද දක්වා. |
| | (III) එච්.ජී. වික්‍රමසිංහ සහකාර පොලිස් අධිකාරී කැලණිය. | 1990 නොවැම්බර් 15 දින සිට 1996 දක්වා. |

| | | |
|---|---|---|
| A1/4 | (I) සහකාර පොලිස් අධිකාරී, ආර්. ධර්මරත්න | 1986 දෙසැම්බර් 16 දින සිට 1989 ජූලි මස 31 වන දින දක්වා |
| | (II) සහකාර පොලිස් අධිකාරී එච්. චන්ද්‍රදාස | 1989 අගෝස්තු මස 02 දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| A 1/5 | (I) පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1990 මැයි මස 05 දින දක්වා |

| | | |
|---|---|---|
| A2/5 | සහකාර පොලිස් අධිකාරී<br>ඩග්ලස් පීරිස් | 1989 අගෝස්තු<br>02 දින සිට<br>1995 මැද දක්වා |
| සටහන: හඳුනාගත් නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථානයක් හෙවත් වධකාගාරයක් ඉදිරිපිට ආසන්නතම පිහිටා තිබේ. ( B 8) | | |

| | | |
|---|---|---|
| A 2/12 | (I) කාර්ය භාර නිලධාරී,<br>පොලිස් ස්ථානය, කැලණිය | 1989 අගෝස්තු<br>02 දින සිට<br>1990 මැද දක්වා |
| ( පාවිච්චියට ගන්නා ලදී. නමුත් කවුරුන් විසින් පාවිච්චි කරන ලද්දේද යන්න ගැන වාර්තා කිසිවක් නැත.)<br>(II) පොලිස් පරීක්ෂක, එන්.එම්.එස්.බී. තිශ්සංක කාර්ය භාර නිලධාරී, කැලණිය — 1990 සැප්තැම්බර් මස 10 දින සිට 1996 දක්වා | | |

| | | |
|---|---|---|
| B 6 | කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරියෙකු පදිංචිව සිටින බව සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් 1989 අගෝස්තු මස 02 වන දින දරන ලිපියකින් පිළිගෙන ඇත. (X 65) යනුවෙන් සලකුණු කර ඇති ලියවිල්ල) මෙම නිලධාරියාගේ අනන්‍යතාවය ගැන සාක්ෂියක් නැත. | |

| | | |
|---|---|---|
| *B 8 | සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට වෙන් කරන ලද ආරක්ෂක නිලධාරීන් | 1988 සිට 1991 දක්වාවූ කාලසීමාව |

සටහන : තමා නීති විරෝධීව රඳවා ගෙන වධ දීමට ලක් කළ නිවස වශයෙන් සාක්ෂිකරු අර්ල් සුගී පෙරේරා විසින් හඳුනා ගන්නා ලදී. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් වාසය කළ නිවස ඉදිරිපිට ඊට ආසන්නතමව පිහිටා තිබේ. මෙම නිවස පිහිටා තිබෙන්නේත් රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරී, පොලිස් පරීක්ෂක, සුදත් චන්ද්‍රසේකර පදිංචිව සිටි නිවසට ආසන්නතමව යාබදවය.

| | | |
|---|---|---|
| B 10 | (I) පොලිස් කොස්තාපල් රණතුංග<br>කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන<br>ඒකකයට අනුයුක්ත නිලධාරී<br><br>(II) පොලිස් කොස්තාපල්<br>වී.ඒ. සුනිල් පෙරේරා | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1990 අග හරිය දක්වා<br><br>1991 පෙබරවාරි මස 15 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 13 | ප්‍රධාන පොලිස් පරීක්ෂක,<br>රංජිත් වික්‍රමසිංහ<br>කාර්ය භාර නිලධාරී,<br>කඩාකප්පල්කාරී ක්‍රියා මර්ධන ඒකකය කැලණිය | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |
| B 20 | කාන්තා පොලිස් කොස්තාපල්,<br>කාන්ති ප්‍රනාන්දු<br>කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට<br>අනුයුක්ත නිලධාරිනී | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 21 | පොලිස් සැරයන්<br>ලක්ෂ්මන් ඩයස්<br>කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට<br>අනුයුක්ත නිලධාරී | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

| | | |
|---|---|---|
| B 23 | පොලිස් කොස්තාපල් හීන්බණ්ඩා<br>කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා<br>මර්දන ඒකකයට අනුයුක්ත නිලධාරී | 1989 අගෝස්තු මස 02 වන දින සිට 1996 දක්වා |

*B 34 සපුගස්කන්ද පොලිස් ස්ථානයට පවරා දෙන ලදී.

**සටහන: තමා නීති විරෝධීව රඳවා ගෙන වධ දෙනු ලැබූ ස්ථානය ලෙස සාක්ෂිකරු වාසල ජයසේකර විසින් මෙම නිවස හඳුනා ගන්නා ලදී.**

III කිසිත් අවසරයක් නොමැතිව පොලිස් නිලධාරීන් විසින් පාවිච්චි කරන ලද නිවස

* ඒ1/8 අළුත්වැඩියා කිරීම අවශ්‍යවීම නිසා අත්හැර දමන ලද නිවාසය

මෙහි පොලිස් නිලධාරීන් නිතර ගැවසුන බව රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ නිලධාරීන්ට පෙනී ඇත. සංස්ථාවේ ඇවරකරුවන අශෝක සේනානායක මහතාට ඒ බව දන්වන ලදී. ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයට දන්වා ඇත. රනිල් වික්‍රමසිංහ මහතාටත් ඔහු දන්වා ඇත. මේ ගැන ක්‍රියා කර නැත. තත්ත්වය එසේම පැවති ඇත. පුද්ගලයින් නීතිවිරෝධීව රඳවා තබාගෙන වධ දුන් ස්ථානයක් ලෙසට සාක්ෂිකරු අජිත් ජයසිංහ මෙය හඳුනා ගත්තේය. රනිල් වික්‍රමසිංහ මහතාගේ ආරක්ෂක නිලධාරීන් පදිංචිව සිටි ඒ 1/7 නිවාසයට යාබදවම පිහිටා ඇත.

පොලිස් නිලධාරීන්ගේ සංවිධානමය ව්‍යුහය

(කොමිෂන් සභාවට අදාළ අය)

